සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
Third Term Test - Grade 9 - 2019

නම : .... **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය** කාලය : පැය 01 මි.30යි.

I ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. සුදුසු පරිදි යා කරන්න.

01.	ක්‍රමලේඛක
02.	ජාල පරිපාලක
03.	පද්ධති විශ්ලේෂක
04.	වෙබ් සංවර්ධක
05.	පරිගණක යෙදුම් සහායක

A	වෙබ් අඩවි සැලසුම් කිරීම සහ සංවර්ධනය
B	තොරතුරු පද්ධති සැලසුම් කිරීම
C	යතුරු ලියනය, පරිගණක ආශ්‍රිත නිර්මාණ සහ සංස්කරණය
D	පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය
E	පරිගණක ජාල පරිපාලනය සහ නඩත්තුව

02. පහත දක්වා ඇති රූපයේ හිස්තැන්වලට අදාළ නිවැරදි ලේබලය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය හිස්තැන මත ලියන්න.



(A) - ලේඛන මුද්‍රණය කර ගැනීම (Print)
(B) - ලේඛනයක් තැන්පත් කිරීමට (Save)
(C) - තැන්පත් කළ ලේඛනයක් විවෘත කිරීමට (Open)
(D) - ලේඛනයක මුද්‍රණ පෙර දසුන බලා ගැනීමට (Print Preview)
(E) - නව වැඩපතක් ලබා ගැනීම (New)

03. පහත අසා ඇති ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුරු ලියන්න.

(i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව නිසා සමාජීය වශයෙන් වෙනස්කම් සිදු වී ඇති ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

(1) .... (2) ....

(ii) තාක්ෂණයේ දියුණුවත් සමග සෞඛ්‍ය අංශයේ රෝග හඳුනා ගැනීම සඳහා භාවිතා කරන ඔබ දන්නා උපකරණ දෙකක් ලියන්න.

(1) .... (2) ....

(iii) 3R ක්‍රමවේදය හරහා විද්‍යුත් අපද්‍රව්‍ය අවම කළ හැකිය. 3R ක්‍රමවේදයේ කියවෙන සංකල්ප 03 මොනවාද?

(1) ....

(2) ....

(3) ....

04. පහත දැක්වෙනුයේ එක්තරා පාසලක සිසුන් පස්දෙනෙකු සතියක කාලයක් තුළ තම මුදල් වියදම් සටහන් කර ඇති පැතුරුම්පත් මෘදුකාංගයක කොටසකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

G15 | fx

	A	B	C	D	E	F	G	H	I	J
1	අංකය	නම	සඳුදා	අඟහරුවාදා	බදාදා	බ්‍රහස්පතින්දා	සිකුරාදා	මුළු වියදම	සාමාන්‍ය	අවම මුදල
2	1	රනිඳු	රු. 25.00	රු. 32.00	රු. 18.00	රු. 20.00	රු. 15.00			
3	2	කවීන්	රු. 12.00	රු. 15.00	රු. 20.00	රු. 13.00	රු. 14.00			
4	3	තිසරි	රු. 35.00	රු. 30.00	රු. 15.00	රු. 14.00	රු. 18.00			
5	4	සුමුදු	රු. 41.00	රු. 24.00	රු. 11.00	රු. 16.00	රු. 20.00			
6	5	දසුන්	රු. 21.00	රු. 16.00	රු. 13.00	රු. 20.00	රු. 18.00			
7										

(i) රනිඳු සතියේ දින පහ තුළ වියදම් කළ මුළු මුදල H2 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න. ....

(ii) රනිඳුගේ මුළු වියදමෙහි සාමාන්‍යය I2 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

....

(iii) රනිඳු වියදම් කර ඇති අවම මුදල J2 කෝෂයට ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු ශ්‍රිතය ලියා දක්වන්න.

....

(iv) A7 කෝෂයෙහි = COUNT (A1:A6) යන ශ්‍රිතය ඇතුළත් කළහොත් එහි දිස්වෙන අගය කුමක් ද?

....

(v) සිසුන් සියලු දෙනා දින පහ තුළ වියදම් කළ මුදල් අගයන් දැක්වීමට සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක් නම් කරන්න.

....

....

05. (i) ඔබ දන්නා සංවේදක සහ ක්ෂුද්‍ර පාලක සහිත උපකරණ 3ක් ලියා දක්වන්න.

....

....

....

(ii) පහත රූපයේ ඇතුළත් ක්ෂුද්‍ර පාලක පුවරුවේ කොටස් නම් කරන්න. ඒ සඳහා දී ඇති පද ලැයිස්තුවට යොදා ඇති අංකය භාවිත කරන්න.

1. ATMEGA 328p	4. විදුලි තුඩු
2. MINI USB	5. විදුලි නියාමකය
3. DC විදුලි සැපයුම	



06. ශිෂ්‍ය නාම ලේඛනය ලකුණු කිරීම සලකන්න. මෙහි දී සිසුවා පැමිණ සිටී නම් නාමලේඛනය 1 ලෙසද, පැමිණ නොසිටී නම් 0 ලෙසද, සටහන් කිරීමට අදාළ අසම්පූර්ණ ගැලීම් සටහන පහත වරහන් තුළ දී ඇති පද අතරින් තෝරා හිස්තැන් පුරවන්න.

(අවසානය, ප්‍රකාශ කිරීමට තවත් නම් තිබේද?, ආරම්භය, පැමිණීම 0 ලෙස සටහන් කිරීම, සිසුවා පැමිණ සිටී ද?)



A ....

B ....

C ....

D ....

E ....

07. පහත A තීරුවේ දක්වා ඇති ප්‍රකාශයන්ට වඩාත් ගැළපෙන රූපය B තීරුවෙන් තෝරා යා කරන්න.

A

(i) මංහසුරුව (Router)

(ii) ස්විචය (Switch)

(iii) RJ 45 කේබලය

(iv) සේවාදායකය (Server)

(v) ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත (NIC)

B

08. **දී ඇති පද අතරින් සුදුසුම පද භාවිත කර හිස්තැන් පුරවන්න.**

දෘඪ තැටිය, වගකීම, ද්විතීක මතකය, වේගය, පරිගණක තිරය, ධාරිතාවය, කෙවෙනි

(i) සකසනයේ .... මනිනු ලබන්නේ තත්පරයකට ක්‍රියාත්මක කෙරෙන උපදෙස් සංඛ්‍යාව මගිනි.

(ii) පරිගණකයේ ප්‍රධානතම ප්‍රතිදාන උපාංගය .... වේ.

(iii) ප්‍රධාන මතකයේ .... මෙගා බයිට් (MB) හෝ ගිගා බයිට් (GB) යන ඒකකවලින් දක්වනු ලැබේ.

(iv) පරිගණක යන්ත්‍රයක් මිලදී ගන්නා විට ලබා දෙන .... සලකා බැලිය යුතු වැදගත් සාධකයකි.

(v) පරිගණකයකට පර්යන්ත උපාංග සම්බන්ධ කිරීම .... හරහා සිදුවේ.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
Third Term Test - Grade 9 - 2019

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - පිළිතුරු පත්‍රය

01. D E B A C (ල. 2 5 5 = 10)

02. 1 - E, 2 - C, 3 - A, 4 - B, 5 - D (ල. 2 5 5 = 10)

03. (i) අධ්‍යාපන, සෞඛ්‍ය, බැංකු වැනි නිවැරදි ක්ෂේත්‍ර 2 සඳහා (ල. 2 5 2 = 4)
(ii) ECG, EEG, CAT අධි රුධිර පීඩනය මනින උපකරණ වැනි නිවැරදි උපකරණ 2 සඳහා (ල. 2 5 2 = 4)
(iii) Reduce අනවශ්‍ය භාණ්ඩ එක් රැස් කිරීම හා මිලදී ගැනීම අවම කිරීම
Reuse - හැකි සෑම විටම අළුත් වැඩියා කර නැවත භාවිත කිරීම.
Recycle - අනවශ්‍ය සියල්ල ප්‍රතිචක්‍රීකරණය කිරීම (ල. 2 5 3 = 6)

04. (i) SUM (ii) AVERAGE (iii) MIN (iv) 5
(v) ස්ථම්භ ප්‍රස්ථාර, දඬු ප්‍රස්තාර (ල. 3 5 5 = 15)

05. (i) රෙදි සෝදන යන්ත්‍රය, ක්ෂුද්‍ර තරංග උදුන, සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන විදුලි ලාම්පු (ල. 2 5 3 = 6)
(ii)



(ල. 2 5 5 = 10)

06. A - ආරම්භය
B - සිසුවා පැමිණ සිටී ද
C - ප්‍රකාශ කිරීමට තවත් නම් තිබේ ද?
D- පැමිණීම 0 ලෙස සටහන් කරන්න.
E - නිමාව (ල. 2 5 5 = 10)

07. A | B

(i) මංහසුරුව (Router)
(ii) ස්විචය (Switch
(iii) RJ 45 කේබලය
(iv) සේවාදායකය
(v) ජාලකරණ අතුරු මුහුණත් කාඩ්පත (NIC)

(ල. 2 5 5 = 10)

08. (i) වේගය (ii) පරිගණක තිරය (iii) ධාරිතාව (iv) වගකීම
(v) කෙවෙනි (ල. 3 5 5 = 15)